සියලු ම හිමිකම් ඇවරිණි /All Rights Reserved

Paper 9

සාමාන්‍ය පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය ලක්ෂ්මන් ගුණරත්න සාමාන්‍ය පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණය
Business & Accounting studies Odinary Level Lakshman Gunarathna Business & Accounting studies Odinary Level Lakshman Gunarathna සාමාන්‍ය පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය ලක්ෂ්මන් ගුණරත්න ගිණුම්කරණය

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2022
# General Certificate of Education (Advanced Level ) Examination 2022

ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය

60 | s | I | නම-

(1) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරයි. ඒවා ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) ප්‍රාග්ධන සූක්ෂම නිෂ්පාදන ව්‍යාපාර හා ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ව්‍යාපාර
(2) අදහස් නිෂ්පාදන ව්‍යාපාර හා භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
(3) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා නිෂ්පාදන ව්‍යාපාර
(4) සේවා නිෂ්පාදන ව්‍යාපාර හා භාණ්ඩ බෙදා හැරීමේ ව්‍යාපාර

(2) සමාජය තුළ සිල්ලර වෙළඳ සැල් බොහෝමයක් දැකිය හැක. සිල්ලර වෙළඳ ආයතන අයත් වන්නේ කිනම් ව්‍යාපාර වර්ගයට ද?
(1) සේවා ව්‍යාපාර (2) නිෂ්පාදන ව්‍යාපාර
(3) බෙදාහරීමේ ව්‍යාපාර (4) මූල්‍ය සම්පාදන ව්‍යාපාර

(3) අදීෂ පෞද්ගලික රක්ෂන සමාගමක් ආරම්භ කරයි. මෙම නිෂ්පාදිතය අයත් වන්නේ,
(1) සේවා ව්‍යාපාර (2) නිෂ්පාදන ව්‍යාපාර
(3) බෙදාහරීමේ ව්‍යාපාර (4) මූල්‍ය සම්පාදන ව්‍යාපාර

(4) සේවාවල ලක්‍ෂණයක් නොවන්නේ,
(1) ගබඩා කළ හැකි වීම (2) සපයන්නා අනුව ගුණත්වය වෙනස් වීම
(3) අදෘෂ්‍යමය වීම (4) එක් වරක් භාවිත කළ පසුව අහෝසි වී යාම

(5) භාණ්ඩවල ලක්‍ෂණයක් නොවන්නේ,
(1) සපයන්නා අනුව ගුණත්වය වෙනස් වීම. (2) ගබඩා කර තබා ගත හැකි වීම.
(3) දෘෂ්‍යමය වීම. (4) කීප වරක් භාවිත කළ හැකි වීම.

(6) සේවාවක ලක්‍ෂණයක් නොවන්නේ,
(1) ගබඩා කල හැක (2) ස්පර්ශ කල නොහැක
(3) සපයන්නා අනුව වෙනස් වේ (4) නිෂ්පාදනය හා පාරිභෝජනය එකවර සිදුවේ

(7) භාණ්ඩ හා සේවා අතර වෙනස හඳුනාගත හැක්කේ,
(1) මිල මත ය (2) ඉල්ලුම මත ය (3) සැපයුම මත ය
(4) ස්පෘශ්‍යතාව මත ය

(8) භාණ්ඩ හා සැසඳීමේ දී සේවාවක දැකිය හැකි ගති ලක්ෂණයක් වන්නේ,
(1) ස්පර්ශ කළ හැකි වීම ය (2) ඒකාකාරී වීම ය
(3) වෙන් කළ හැකි වීම ය (4) ගබඩා කළ නොහැකි වීම ය

(9)

| | |
|---|---|
| 1. ව්‍යවසාය | A. ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු මතුපිට මෙන් ම අභ්‍යන්තරයේ පවත්නා සම්පත් |
| 2. ප්‍රාග්ධනය | B. ව්‍යාපාරය සඳහා යෙදවෙන කායික හා මානසික දායකත්වය |
| 3. භූමිය | C. නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ |
| 4. ශ්‍රමය | D. නිෂ්පාදනයට අවශ්‍ය භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක සංවිධාන කරමින් නිෂ්පාදනය යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වා ගෙන යාමේ කාර්යය |

(1) 1 – A, 2 – B, 3 – C, 4 – D (2) 1 – B, 2 – C, 3 – A, 4 – D
(3) 1 – D, 2 – C, 3 – B, 4 – A (4) 1 – D, 2 – C, 3 – A, 4 – B

(10)

| | |
|---|---|
| 1. ව්‍යවසාය | A. ඉඩම්, ස්වභාවික සම්පත්, ඛනිජ සම්පත්, වන සම්පත්, පස |
| 2. ප්‍රාග්ධනය | B. කය වෙහෙසා වැඩ කරන පුද්ගයෝ, පතල් සේවකයෝ, මනස වෙහෙසා වැඩ කරන පුද්ගලයෝ, ගණකාධිකාරීවරු, කළමනාකරුවෝ |
| 3. භූමිය | C. යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, රථ වාහන, මුදල් |
| 4. ශ්‍රමය | D. අයිතිකරු, සංවිධානය කරන්නන් |

(1) 1 – 2, 2 – B, 3 – C, 4 – D (2) 1 – B, 2 – C, 3 – A, 4 – D
(3) 1 – D, 2 – C, 3 – B, 4 – A (4) 1 – D, 2 – C, 3 – A, 4 – B

(11) නිෂ්පාදන සාධක යනුවෙන් අදහස් වන්නේ,
(1) කරණය කරන ශිල්පීය ක්‍රමයන් ය. (2) ප්‍රාග්ධන සූක්ෂම හා ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ය.
(3) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ගොඩනැගිලි (4) නිෂ්පාදනය සඳහා අවශ්‍ය වූ විවිධ සම්පත් ය.

(12) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය සම්පත් නිෂ්පාදන සාධක වේ. එම සාධකයන් අයත් කාණ්ඩය තෝරන්න.
(1) භූමිය, ප්‍රාග්ධනය, වාහන, මුදල් (2) ව්‍යවසාය, මුදල්, ශ්‍රමය, වාහන
(3) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය (4) ප්‍රාග්ධනය, ශ්‍රමය, මුදල්, භූමිය

(13) ව්‍යවසාය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) කිසියම් නිෂ්පාදනයක් කිරීමයි.
(2) නිෂ්පාදන සාධක සංයෝග කර නිෂ්පාදනයක් කිරීමයි.
(3) ව්‍යාපාරය කළමනාකරණයයි. (4) ව්‍යාපාර පාලනය කිරීමයි.

(14) ප්‍රාග්ධනය නිෂ්පාදන සාධකයට නිදසුන් ලෙස දැක්විය හැක්කේ,
(1) ඉඩම්, ස්වාභාවික සම්පත් (2) සේවකයන්, කළමනාකරුවන්
(3) මුදල්, යන්ත්‍ර, ගොඩනැගිලි (4) අයිතිකරු, සංවිධානය කරන්නන්

(15) ව්‍යවසාය නිෂ්පාදන සාධකයට ඇතුළත් වන්නේ,
(1) මුදල්, යන්ත්‍ර සූත්‍ර (2) ඉඩම්, ස්වාභාවික සම්පත්
(3) සේවකයන්, කළමනාකරුවන් (3) අයිතිකරු, සංවිධානය කරන්නන්

(16) නිෂ්පාදන සාධකයන් ලෙස වර්ග කළ නොහැකි සාධකය තෝරන්න.
(1) භූමිය (2) ජනගහනය (3) ශ්‍රමය (4) ප්‍රාග්ධනය

(17) ව්‍යවසායකයකුගේ ප්‍රධානතම කාර්යය විය යුත්තේ,
(1) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදනය සාධක සංයෝග කිරීමයි.
(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා නව්‍යතා සම්පාදනයයි.
(3) ව්‍යාපාර කළමනාකරණය කටයුතුවලට සහභාගී වීමයි.
(4) ආයෝජන ක්‍රියාවලියට දායකවීමයි.

(18) පාසලක ඇල්මැති පාර්ශ්වයන් වන්නේ,
(1) අයිතිකරුවන් (2) ගුරුවරුන් (3) සැපයුම්කරුවන්
(4) මූල්‍යායතන

(19) ප්‍රජාව විසින් ද ව්‍යාපාර වෙත ඇල්මක් දක්වයි. එහි මූලික අරමුණ වන්නේ,
(1) ප්‍රමාණවත් ලාභයක් උපයා ඇද්ද යන්න දැන ගැනීමට
(2) කළමනාකරණ කටයුතු සාර්ථක වී ඇද්ද යන්න දැන ගැනීමට
(3) රජයට ලැබිය යුතු බදු ආදායම් නිසි ලෙස ගෙවන්නේ ද යන්න දැන ගැනීමට
(4) සමාජයට වන සේවාව පිළිබඳ අවධානය යොමු කිරීමට

(20) රජයක් විසින් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දැක්වීමේ මූලික අරමුණ වන්නේ,
(1) සමාජයට ව්‍යාපාරයෙන් වන සේවාව පිළිබඳ අවධානය යොමු කිරීම.
(2) පාරිභෝගිකයන් සුරක්ෂිත වන ආකාරයට ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ ද දැන ගැනීම.
(3) කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කල හැකි ද යන්න විමසීම.
(4) කළමනාකරණ කටයුතු සාර්ථක වී ඇද්ද යන්න විමසීම.

(21) පහත සඳහන් පාර්ශ්වයන්ගෙන් සමූපකාරයකට ඇල්මක් නොදක්වන පාර්ශ්වය වන්නේ,
(1) රජය (2) කළමනාකරුවන් (3) සේවකයන්
(4) පන්සල්

lakshman Gunarathna